**1. විසර්ජන ශීර්ෂය 115 ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2010**

ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 දෙසැම්බර් 27 දින අමාත්‍යාංශයේ ලෙකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය**

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

(i) <u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 96,915,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 88,003,438 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 8,911,562 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 9% කි. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය | සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය | තත්‍ය වියදම (2010.12.31 දිනට) | ඉතිරිය (2010.12.31 දිනට) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 92,440,000 | 82,595,000 | 76,344,584 | 6,250,416 | 7.6 |
| මූලධන | 4,475,000 | 14,320,000 | 11,658,854 | 2,661,146 | 18.6 |
| **එකතුව** | **96,915,000** | **96,915,000** | **88,003,438** | **8,911,562** | |

(ii) <u>අයවැය විචලනය</u>

මෙහෙයුම් වැඩ සටහනේ ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට අදාලව රු. 1,100,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

**(ආ) අතිරික්තතා හා සීමා පිළිනොපැදීම**

බණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අමාත්‍යාංශය වෙනුවෙන් දරා ඇති වියදම් අමාත්‍යාංශය විසින් දැරුවේ නම් පහත සඳහන් වැය විෂයන්ගේ සීමා ඉක්මවීම් සිදුවන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය | අමාත්‍යාංශය විසින් දරන ලද වියදම | බණිජතෙල් නීතිගත සංස්ථාව විසින් දරන ලද වියදම | දරා ඇති මුළු වියදම | ශුද්ධ ප්‍රතිපාදන | ඉක්මවීම |
|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු |
| 115-1-1-1301 | 2,797,438 | 3,554,667 | 6,352,105 | 3,000,000 | 3,352,105 |
| 115-1-1-1002 | 1,654,995 | 1,112,832 | 2,767,827 | 1,675,000 | 1,092,827 |

**මේ සම්බන්ධයෙන් 2012 ජනවාරි මාසයේදී බණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පහත සඳහන් අන්දමට මා වෙත වාර්තා කර තිබුණි.**

"මෙම අමාත්‍යාංශය වෙත 2010 වර්ෂය තුළ ඇස්තමේන්තු වලින් ප්‍රතිපාදනය කරන ලද සීමාවන් තුල වියදම් කර ඇති අතර ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව විසින් දරන ලද වියදම් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉක්මවීමක් වශයෙන් දැක්වීම පිළිබඳ එකඟ විය නොහැක. මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිළධාරී වශයෙන් ලංකා බනිජතෙල නීතිගත සංස්ථාවට මෙම වියදම් දරන ලෙස මා විසින් ඉල්ලීමක්ද කර නොමැති බව දන්වා සිටිමි."

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 11501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 106,586 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

### වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

2010 මැයි 14 දිනැති අංක සීඒ/1 /17/1 දරන ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ හෝ පරිහරණය සඳහා රාජ්‍ය සංස්ථාවක වාහන යොදාගන්නේ නම් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගතයුතු වුවත් ඊට පටහැනිව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ වාහන 5 ක් අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.4,865,823 ක වියදමක් සංස්ථාව විසින් දරා තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

### නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | **මුදල් රෙගුලාසි** | | |
| (අ) | මු.රෙ. 237, මු.රෙ. 237 (ආ) හා මු.රෙ 115 | 676,026 | 2009 වර්ෂය සඳහා දින පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.676,026 ක් ගෙවා තිබුණි. |

මු.රෙ. 237 අනුව ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ ලැබුණු බවට තහවුරුවක් ලබාගෙන ගෙවීම් සහතික කිරීම සිදුකළ යුතු අතර මු.රෙ. 237 (ආ) විධි විධාන ප්‍රකාරව ගබඩාවට භාණ්ඩ ලැබී ඇති බවට හා අදාල බඩු ලේඛන, තොග පොත් යනාදියෙහි ඇතුළත් කර ඇති බවට සහතිකයක් වවුචර්වල අමුණා තිබිය යුතු වුවත් එම විධි විධාන අනුව කටයුතු කර නොතිබුණි. මීට අමතරව මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව මිල කැඳවීමක් සිදු කර නොතිබුණි.

(ආ) මු.රෙ. 752

ඉන්වෙන්ට්‍රි ලැබීම් හා නිකුතකිරීම් ඉන්වෙන්ට්‍රි ලේඛනයන්හි ඇතුලත් කිරීමේදී ලැබීම් නියෝග හා නිකුත්කිරීමේ නියෝග භාවිතා කළ යුතු වේ. අමාත්‍යාංශයේ ප්‍රධාන ගබඩාවෙන් විවිධ අංශ වලට භාණ්ඩ නිකුත් කිරීමේදී නිකුත් නියෝගයක් මගින් විධිමත් පරිදි නිකුත් කිරීමක් හෝ අදාල අංශයෙන් ලැබීම් නියෝගයක් ගෙන්වා ගැනීමක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රධාන ගබඩාවෙන් විවිධ අංශවලට නිකුත් කරනු ලබන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අදාල අංශයන්හි ඉන්වෙන්ට්‍රි ලේඛන වල විධිමත්ව සටහන්වී ඇත්ද යන්න තහවුරු කරගත නොහැකි විය.

**(ii) චක්‍රලේඛ විධිවිධාන**

**ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන චක්‍රලේඛයේ 2.3 වගන්තිය | 2,112,271 | සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික ආයතනයකින් ජීප් රථයක් මිලදී ගෙන තිබූ අතර චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව මිලදී ගනු ලබන ජීප් රථයක උපරිම වටිනාකම සියළුම බදු හා ගාස්තු ඇතුළුව රු.මි.7.5 ක් විය යුතු වුවත් මෙම මිලදී ගැනීමේදී රු.2,112,271 කින් එම සීමාව ඉක්මවා තිබුණි. |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ 1/17/1 දරන රාජ්‍ය වියදම් කළමණාකරන චක්‍ර ලේඛය | 68,259 | චක්‍රලේඛයේ දක්වා ඇති උපරිම දුරකථන ගාස්තු සීමාව ඉක්මවා අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකුට රු.68,259 වියදමක් දරා |

| | | |
|---|---|---|
| | | තිබුණි. |
| **(iii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 1,447,500 | චක්‍රලේඛය ප්‍රකාරව විදෙස් සංචාර සඳහා ගුවන් ටිකට්පත් ලබා ගැනීමේදී ලංකා බැංකුව වෙතින් හෝ මහජන බැංකුවේ පීපල්ස් ට්‍රැවල්ස් යන ආයතනවලින් මිලදී ගත යුතු වුවත්, එම විධි විධාන වලට පටහැනිව අවස්ථා 7කදී රු.1,447,500 ක් වටිනාකමැති ගුවන් ටිකට්පත් පෞද්ගලික ආයතනවලින් මිලදී ගෙන තිබුණි. |

## 1.6 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම්**

**පරිගණක මිලදී ගැනීම**

i. අමාත්‍යාංශය විසින් රු. 169,600 කට Note Book පරිගණක 02 ක් ද රු. 534,000 කට Desktop පරිගණක 06 ක් ද මිලට ගෙන තිබූ අතර මෙම මිලදී ගැනීම් පිරිවිතරයන්ට අනුකූලද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව පරීක්ෂා කළ බවට තොරතුරු හෝ ඒ සම්බන්ධ ප්‍රසම්පාදන කමිටු තීරණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ii. අමාත්‍යවරයාගේ විදේශ සංචාරවලදී හා ශ්‍රී ලංකාවට පැමිණි නියෝජිතයන් හට සමරු තිළිණ වශයෙන් ලබා දීම සඳහා අවස්ථා 6කදී රු.839,000 ක වියදමක් දරා තිබූ නමුත් එම මිලදී ගැනීම් සඳහා විධිමත් පරිද මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබුණි.

**(ආ) වෙනත්**

2009 ඔක්තෝබර් 08 දිනැති අංක පී.ආර්.ඞී./1/2/90 දරන බණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්වරයාගේ ලිපිය මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ රහස්‍ය ලේකම් වරියක ලෙස සේවය කරන නිලධාරිනියක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම් තනතුරට පත්කර තිබුණු අතර ඇය ලංකා විදුලිබල මණ්ඩලයෙන් පූර්ණ ලෙස නිදහස් කර තිබුණි. 2009 ඔක්තෝබර් 06 දින සිට 2010 මැයි 11 දින දක්වා කාලය තුල ලංකා විදුලිබල මණ්ඩලයෙන් වැටුප් හා දීමනා ලෙස රු.287,785 ක් ගෙවා තිබුණු අතර වැටුපෙන් 1/4 ක් දීමනාවක් ලෙස අමාත්‍යාංශය විසින් රු.70,094 ක් ගෙවා තිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 07 | 07 |
| (ii) | තෘතීක මට්ටම | 36 | 25 | 11 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 27 | 23 | 04 |
| (iv) | වෙනත්(අනියම්/ තාවකාලික/ | | | |

| | | | |
|---|---|---|---|
| කොන්ත්‍රාත් පදනම) | - | 05 | - |
| **එකතුව** | 77 | **60** | 22 |

1.8 අභ්‍යන්තර පාලනය

**අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 වැනි මුදල් රෙගුලාසිය හා 1998 අගෝස්තු 03 වැනි දිනැති අංක IAI /98/02 භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව සෑම ආයතනයකම විෂය පථයට අයත් අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාට වගකිවයුතු ජ්‍යෙෂඨ ගණකාධිකාර්වරයකු විසින් නායකත්වය දරන අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිට විය යුතු වුවත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.